විශිෂ්ට පරමාදර්ශී අභිමානවත් පළාත් සභා රාජ්‍ය සේවයක්

**පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත**

**மாகாண சபை அரசாங்க சேவை ஆணைக்குழு – மேல் மாகாணம்**

**PROVINCIAL COUNCIL PUBLIC SERVICE COMMISSION – WESTERN**

අංක 628,10 වන මහල,ජන ජය සිටි ගොඩනැගිල්ල,නාවල පාර,රාජගිරිය இல.628, 10 வதுமாடி, ஜனஜயசிட்டிவளாகம், நாவலவீதி, ராஜகிரிய No.628,10th Floor,Jana Jaya City Building,NawalaRoad,Rajagiriya

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | WPC/PSC/EXM02/DO-I/EB/2025 | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2025.09. 09 |

ප්‍රධාන ලේකම් (බ.ප.),
ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
සියළුම අමාත්‍යාංශ අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.)

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී සේවයේ (I ශ්‍රේණිය) තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2025 (II)**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී සේවයේ (I ශ්‍රේණිය) තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2025 (II) වෙනුවෙන් ඇමුණුම 01හි සඳහන් 2025.09.09 දිනැති නිවේදනය මගින් අයදුම්පත් කැඳවා ඇත.

02. ඒ සඳහා අයදුම්කරනු ලබන බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී I ශ්‍රේණිය සඳහා උසස්වීම ලබා ඇති සුදුසුකම්ලත් අයදුම්කරුවන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.wp.gov.lk ඔස්සේ මාර්ගගත ක්‍රමය මගින් (Online) **2025.09.19** දිනට පෙර අයදුම් කල යුතු අතර, එම අයදුම්පත්වල මුද්‍රිත පිටපත් **2025.09.30** දිනට පෙර නියමිත ධූරාවලිය ඔස්සේ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කල යුතුය. මෙම දින වලින් පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. මෙම විභාග සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන නිලධාරීන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී I ශ්‍රේණියට උසස්වීමේ ලිපිය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් නිකුත් කර තිබීම අනිවාර්යය වේ.

04. මේ සම්බන්ධයෙන් ඔබ කාර්යාලයේ හා ඔබ යටතේ වන කාර්යාලවල නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත්, මෙම විභාගයට පෙනී සිටීමට අයදුම්කරුවන් නොමැත්තේ නම් ඒ බවද දන්වා එවීමට කටයුතු කරන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

තිලක් සෙනරත්
ලේකම්,
පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

Tel – 0112879614
Fax – 0112879512
email – ppscwprec@sltnet.lk

## බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී සේවයේ (I ශ්‍රේණිය) තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2025 (II)

➢ **සැලකිය යුතුයි - සියලුම අයදුම්කරුවන් මාර්ගගත ක්‍රමය (Online) යටතේ පමණක් අයදුම්කළ යුතුය.**

01. උක්ත විභාගය යථා කාලයේදී බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන අතර එම දිනය දන්වා එවනු ලැබේ. මෙම විභාගය පවත්වන දිනය පිළිබඳව බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

02. යෝග්‍යතාව

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී සේවයේ I ශ්‍රේණියේ නිලධාරීහු පමණක් මෙම විභාගයට පෙනී සිටීම සඳහා සුදුස්සෝ වෙති.

03. විභාගයට පෙනී සිටීම සඳහා සියලුම අයදුම්කරුවන් මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ පමණක් අයදුම්කළ යුතුය. එසේ අයදුම් කිරීමෙන් පසු යොමු අංකය සහිත මුද්‍රිත පිටපත ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් යොමු කළ යුතු අවසාන දිනට පෙර එවීමට කටයුතු කළ යුතුය.

(අ) **2025.09.19** දින හෝ ඊට පෙර මාර්ගගත (Online) ක්‍රමය යටතේ අයදුම් කරන ලද මුද්‍රිත අයදුම්පත්‍ර **2025.09.30** දින හෝ ඊට පෙර ලැබෙන සේ **"ලේකම්, පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප), අංක 628, 10වන මහල, ජනජය සිටි ගොඩනැගිල්ල, රාජගිරිය"** යන ලිපිනයට තම දෙපාර්තමේන්තු ප්‍රධානියා, අමාත්‍යාංශ ලේකම් (බ.ප), මගින් එවිය යුතුය. එසේ කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ.

සටහන : **අයදුම්පත්‍ර බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ හෝ මෙම කාර්යාලයේ වෙනත් නිළධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතුයි.**

(ආ) මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. කිසියම් ඉල්ලුම්පත්‍රයක් තැපෑලෙන් නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කරන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ.

(ඇ) අපේක්ෂකයින් මාර්ගගත ක්‍රමය මඟින් අයදුම්කිරීමේදී නිවැරදිව අයදුම්පත සම්පූර්ණ කල විට යොමු අංකය සහිතව තහවුරු කිරීමේ කෙටි පණිවිඩයක් අයදුම්කරු විසින් ඇතුලත් කරන ලද ජංගම දුරකථන අංකයට ස්වයංක්‍රීයව ලැබෙනු ඇත. එසේ නොලැබුනහොත් අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර නොමැත.

04. උපදෙස් වලට අනුකූලව නිවැරදි යොමු අංකයක් සහිතව මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්කරන ලද අපේක්ෂකයන්ට www.psc.wp.gov.lk වන අපගේ වෙබ් අඩවිය මඟින් ප්‍රවේශ පත්‍ර බාගත කර ගත හැක. ඒ පිළිබඳව විභාගයට සති දෙකකට පමණ පෙර අපේක්ෂකයින් හට කෙටි පණිවිඩයක් මඟින් දන්වනු ලැබේ.

**සටහන: විභාගයට ඇතුලත් කර ගැනීම, විභාගයට පෙනී සිටීමට ඇති යෝග්‍යතාව පිළිගැනීමක් ලෙස සැලකිය යුතු නොවේ.**

05 අපේක්ෂකයන්ගේ අනන්‍යතාව

තමා පෙනී සිටින එක් එක් විෂයයක් පාසා විභාග ශාලාධිපතිට අයදුම්කරු තම අනන්‍යතාව ඒත්තු ගැන්විය යුතුය. මේ සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් පිළිගනු ලැබේ.

1. වලංගු හැඳුනුම්පත
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය
3. වලංගු රියදුරු බලපත්‍රය

**සටහන : විභාග ශාලාවේදී සිය අනන්‍යතාව ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන් නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ.**

06 අසත්‍ය තොරතුරු සැපයීම සම්බන්ධයෙන් දඬුවම්

1. සියළුම අපේක්ෂකයන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීමකින් තොරව මෙම විභාගය සඳහා ඔවුන් සඳහන් කර ඇති සියළු සුදුසුකම් සම්පූර්ණ කළාසේ සලකා විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත

2. මෙම විභාගයේ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙකු ඊට පෙනී සිටීමට **නුසුදුසු** බව පෙනී ගියහොත් විභාගයට පෙරාතුව, විභාගය පැවැත්වෙද්දී හෝ ඉන්පසුව කවර අවස්ථාවකදී වුවද, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය. අපේක්ෂකයෙකු විසින් දැන දැනම අසත්‍ය තොරතුරු සපයා ඇති බව හෝ කිසියම් වැදගත් කරුණක් දැන දැනම වසන් කල බව පෙනී ගිය හොත් ඔහු/ඇය බස්නාහිර පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට ඉඩ තිබේ. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීති උල්ලංඝණය කිරීම වෙනුවෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලැබිය හැකි ඕනෑම දඬුවමකට යටත් වෙයි.

07. විභාග ගාස්තු

පළමු වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තු ගෙවීම අවශ්‍ය නොවේ. ඉන්පසුව විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් විභාග ගාස්තු ලෙස <u>රු.300 /- ක්</u> **බස්නාහිර පළාත් ආදායම් ශීර්ෂ 20-03-02-99 ට බැර වන පරිදි ළඟම පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබා ගන්නා ලද බ.ප 1 ලදුපත** අයදුම්පත්‍රයට නොගැලවෙන සේ අමුණා එවිය යුතුය.

08. විෂය නිර්දේශය

| ප්‍රශ්නා පත්‍රයේ නාම | විෂය නිර්දේශය | කාලය |
|---|---|---|
| ව්‍යාපෘති කළමනාකරණය | i. ව්‍යාපෘතියක් යන්න නිර්වචනය කිරීම<br>ii. ව්‍යාපෘති කළමනාකරණය<br>iii. ව්‍යාපෘති චක්‍රය<br>iv. ව්‍යාපෘති පිළියෙල කිරීම සහ විග්‍රහ කිරීම<br>v. ව්‍යාපෘති ඇගයීම<br>• පිළිගෙවුම් කාලය<br>• ශුද්ධ වර්තමාන වටිනාකම<br>• අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතය<br>• පිරිවැය ප්‍රතිලාභ අනුපාතය<br>• වාර්ෂික සාමාන්‍ය ඉපැයුම් අනුපාතය<br>vi. ව්‍යාපෘති සංවිධානය<br>vii. ඡායා මිල යොදා ගැනීම | පැය 03 |

සටහන : **ප්‍රශ්න පත්‍රයක් සඳහා ලබාදෙන උපරිම ලකුණු ප්‍රමාණය 100 වන අතර, සමාර්ථය ලැබීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා අවම ලකුණු 40 % ක් වත් ලැබිය යුතුය.**

09. අවශ්‍ය වුවහොත් මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍ය තුනෙන්ම පවත්වනු ලැබේ. අපේක්ෂකයින් විසින් තමා පෙනී සිටින සියළුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂා මාධ්‍යයකින් පිළිතුරු සැපයිය යුතුය.

තිලක් සෙනරත්
ලේකම්
පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.
2025.09.09